**මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම -2020**
**---------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

## 1.1 ව්‍යාවනය කළ මතය

**මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.**

## 1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාවනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

**සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.**

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් යටතේ දැක්වෙන රු.12,430,943 ක් වූ තොග, ධාරණ අගය රු.406,546 ක් වූ ස්ථාවර වත්කම් සහ අත ඉතිරි මුදල් රු.173,727 ක් භෞතිකව නොපැවතුණි. රු. 13,011,216 ක් වූ මෙම පාඩු සඳහා ප්‍රතිපාදනයන් ද මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබීම හේතුවෙන් වාර්ෂික/ සමුච්චිත පාඩුව එම ප්‍රමාණයෙන් වැඩි විය යුතු බව නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රකාශනවල පවත්නා වත්කම් භෞතිකව නොපැවතීමට හේතු සහ ඊට වගකිවයුතු පුද්ගලයින් නිශ්චය කිරීමට පරීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් ද කළමනාකරණය විසින් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>දේපළ , පිරියත හා උපකරණ කිසිවක් මේ වන විට සමාගම සතුව නොපවතී . එම දේපළ මේ වන විට හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහය සමාගම විසින් භාවිතා කරනු ලබනු ඇතැයි යන පදනම මත මෙම වටිනාකම සමාගම වෙත ගෙවන මෙන් ලිඛිතව එම සමාගම වෙත දැනුම් දී ඇත . ඉදිරියේදී මේ සඳහා හානිකරණ වෙන්කිරීමක් සිදුකිරීමට කටයුතු කරනු ඇත .තවද රු.12,430,943.00 ක් වූ ද තොග සහ රු.173,727.00 ක් වූ මුදල් ද සඳහා ඉදිරියේදී අධ්‍යක්ෂක මණ්ඩලය තීරණයක් මත හාණිකරන වෙන් කිරීමක් සිදු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු නිරීම හා වත්කම්වල ආරක්ෂාව සඳහා විධි විධාන යෙදීම කළමනාකරණයේ වගකීම වේ. |

### 1.5.2 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ සමුච්චිත අලාභය රු.3,246,376,040 ක් වූ අතර එදිනට සමාගමේ ශුද්ධ වත්කම් රු. 3,171,376,040 ක සෘණ අගයක් නිරූපණය විය. සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 නොවැම්බර් 13 දින සිට නතර කර තිබුණු අතර 2018 පෙබරවාරි 15 දින සමාගම ඇවර කිරීම සඳහා අධ්‍යක්‍ෂක මණ්ඩලය | මාගම්පුර වරාය කළමනාකරණ පුද්ගලික සමාගම කැබිනට් අනුමැතියක් යටතේ පිහිටුවා ඇති බැවින් එය විසුරුවා හැරීම සඳහා ද කැබිනට් අනුමැතියක් ලබා ගතයුතු බව සමාගම විසින් තීරණය කරන ලදී .එබැවින් ඒ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා කැබිනට් | සමාගම ඇවර කිරීමට තීරණය කර ඇති බැවින් එය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු නිලධාරීන් ක්‍රියාකල යුතුය. |

| | |
|---|---|
| විසින් තීරණය කර තිබුණ ද, 2021 මාර්තු 15 දින දක්වාම ඇවරකරුවෙකු පත්කර නොතිබුණි. | පත්‍රිකාව සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය වල පිටපත් දැනටමත් අමාත්‍යංශ ලේකම්තුමා වෙතට භාර දී ඇත . කැබිනට් අනුමැතිය ලැබුණු පසු අවශ්‍යය අනෙකුත් පියවර කඩිනමින් ගනු ඇත . |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| රජයෙන් ලැබිය යුතු ශේෂය | 17,782,563 | මූලාශ්‍ර ලේඛන, ශේෂ සනාථන ලිපි, වයස් විශ්ලේෂණ වාර්තා සහ උපකාරක ලියවිලි | එකඟ වේ මේ පිළිබඳව ඉදිරියේ දී කටයුතු කරනු ඇත. | විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතුකල යුතුය. |
| නැව්තෙල් රක්ෂණය වෙනුවෙන් ලැබිය යුතු ශේෂය | 28,040,453 | | | |
| වෙළඳ ණයගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂය | 3,589,879 | | | |
| ගෙවිය යුතු අනිකුත් දෑ වලට අදාළ ශේෂය | 7,297,497 | | | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට මව් සමාගම වන ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය ලෙස රු.103,666,952 ක් දක්වා තිබුණ ද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව එදිනට සමාගමට ගෙවිය යුතු ශේෂය රු.98,938,252 ක් විය. ඒ අනුව සමාගමට ලැබිය යුතු ශේෂයේ රු.4,728,700 ක වෙනසක් නිරීක්ෂණය | එකඟ වේ. මෙම මුදල් ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් අය කර ගැනීම සඳහා 2021.01.25 වන දින ලිපියක් යවා ඇත.එහෙත් එම මුදල් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් තවමත් ලබා දී නොමැත. | සමාගම වෙත ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. |

විය. මෙම වෙනස්කම සඳහා හේතු වූ කරුණු පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග සාකච්ඡා කර එකඟතාවයකට පැමිණ නොතිබුණි. තවද, ඉහත ශේෂය තුල අන්තර්ගත 2017 වර්ෂයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් අයකරගත යුතු වූ ටග් යාත්‍රා සඳහා වන්දි මුදල් රු.25,719,981 ක්, කළමනාකරණ සේවා ගාස්තු රු.76,547,855 ක් හා සමාගම් පරිශ්‍රයේ පිහිටි ඉන්ධන පිරවුම්හලෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් වාහන සඳහා නිකුත් කර තිබූ ඩීසල් හා පෙට්‍රල් ලීටර් 11,449 ක් සඳහා වූ රු.1,399,116 ක් වූ ශේෂ 2021 මැයි 15 දින දක්වාම සමාගම වෙත ලැබී නොතිබුණි.

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමෙන් අධිකාරියට ලැබිය යුතු මුදල් ලෙස රු.5,800,921 ක් දක්වා තිබුණි. කෙසේ වුවද, සමාගමේ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත මුදල ගෙවිය යුතු මුදලක් ලෙස දක්වා නොතිබුණි. ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලබාගන්නා ලද තොරතුරු අනුව අධිකාරියට ලැබිය යුතු කළමනාකරණ ගාස්තු හා සමාගමේ විවිධ බිල්පත් පියවීම වෙනුවෙන් ඉහත මුදල අධිකාරියට ලැබිය යුතුව පැවතුණි. | මේ සම්බන්ධව සොයා බලා කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග සාකච්ඡා කොට අදාළ මුදල ගෙවිය යුතු ශේෂයක් නම් එය සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කිරීමට කටයුතු කල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් 2014 වර්ෂයේදී නැව් තෙල් මිලදී ගැනීම සඳහා දේශීය පෞද්ගලික බැංකුවකින් ලබා ගෙන තිබූ රු.3,144,178,059 කට සමාන එක්සත් ජනපද ඩොලර් 24,002,438 ක ණය මුදලට අදාලව සමාගම විසින් 2017 වර්ෂයේදී සහ එයින් පසු වර්ෂවලදී ණය වාරික හෝ පොළී මුදල් කිසිවක් ගෙවා නොතිබුණි. සමාගමේ මූල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු වූ රු.180,268,282 ක් වූ පොළී මුදල ද ඇතුලත්ව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ අනුව ගෙවිය යුතු ණය හා පොළී මුදල රු. 971,528,124 ක් වී තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ණය හා පොළී ශේෂය රු. 4,480,972,700 කට සමාන එ.ජ.ඩො.24,038,495 ක් වී තිබුණි. මෙම ශේෂය සම්බන්ධයෙන් සමාගම විසින් 2021 ජනවාරි 12 දින ශේෂය සනාථන කැඳවා තිබුණ ද අදාල බැංකුව විසින් ශේෂ සනාථන ලබා දී නොතිබුණි. ඒ හේතුවෙන් ඉහත සඳහන් ගෙවිය යුතු ණය ශේෂයෙහි නිරවද්‍යතාවය | එකඟ වේ. සමාගමට විරුද්ධව අදාල බැංකුව විසින් 2020 වර්ෂයේදී ගොනු කර ඇති නඩුව පිළිබඳව ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීමක් කරනු ඇත . | ගරු අධිකරණය ලබාදෙන නඩු තීන්දුව ප්‍රකාරව කටයුතුකල යුතු වීම. |

පිළිබඳව අවිනිශ්චිතතාවයක් පැවතුණි. තවද මෙම ණය මුදල ආපසු අයකර ගැනීම සඳහා අදාළ බැංකුව විසින් 2020 වර්ෂයේදී සමාගමට විරුද්ධව නඩුවක් ගොනුකර පවත්වාගෙන යන නමුත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2015 ජූනි 17 දිනැති අංක පීඊඩී3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 2.2 වගන්තිය | චක්‍රලේඛයට අනුව සමාගම එෆ් (F) වර්ගීකරණයට ඇතුළත්වන බැවින් සමාගමේ පාලක මණ්ඩල රැස්වීම් දීමනා ගෙවීම සඳහා නිර්දේශය හා එකඟතාවය ලබා ගත යුතු වේ .තවද , චක්‍රලේඛය අනුව එහි සඳහන් ඒ (A) ඊ (E)දක්වා වූ වර්ගීකරණය අනුව වැඩිම රැස්වීම් දීමනාව වූ රු 12,500.ක් ඒ (A) ශ්‍රේණියේ රජය සතු ව්‍යාපාර සඳහා ගෙවනු ලබයි .එසේ තිබියදී, මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක නොකරන එෆ් (F) වර්ගයේ රාජ්‍ය ව්‍යවසායක් වූ සමාගම 2020 වර්ෂයේදී පවත්වන ලද රැස්වීම් 04 ක් සඳහා සහභාගී වූ එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත පැමිණීමේ දීමනාව රු 25,000.ක් බැගින් රු .47 5,000ක් ද, 2019 හා 2018 වර්ෂ තුළ දී රැස්වීම් 15 ක් පැවැත්වීම වෙනුවෙන් රු .1,875 000, ක් චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි . | 2020 ජනවාරි 13 වන දින ජනාධිපති චක්‍ර ලේඛන අංක පීඑස්/එස්පී/චක්‍රලේඛ/02/2020 ට අනුව අධ්‍යක්ෂක මණ්ඩල සමාජික දීමනාව මසකට රු.25,000.00 ක් දක්වා ගෙවිය හැක.මීට පෙර පැවති 2019 සහ 2018 රැස්වීම් සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතින්ට යටත්ව ගෙවා ඇත. | විධිමත් අනුමැතියකින් තොරව ගෙවන ලද මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.8 වගන්තිය | සමාගම් ලේකම් විසින් අධ්‍යක්ෂක මණ්ඩල තීරණවල ප්‍රගතිය සොයාබලා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා කලයුතු වුවත් සමාගම විසින් වර්ෂය තුළදී එසේ සිදුකර නොමැති බව විගණනයේදී අනාවරණය විය. | එකඟ වේ. මේ සඳහා සමාගම් ලේකම් වෙත උපදෙස් ලබා දී ඇති අතර, එය සමාගම් ලේකම්ගේ වගකීමකි. | අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු වීම. |

### 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ අනුව ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ශේෂය රු.5,037,187 ක් වූ නමුත් එයින් රු.3,021,258 කට අදාල බදු සහතිකපත් විගණනයට ඉදිරිපත් නොවුණි. තවද, බදු සහතිකපත් නොවීම හේතුවෙන් ඉහත ලැබිය යුතු ශේෂය උපලබ්ධිවීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය. | සියළුම බදු සම්බන්ධ ගෙවීම්, ඇපැල ඉදිරිපත් කිරීම් ආදී කටයුතු සිදු කරමින් පවතී, මෙම අගය ද ඉතාමත් ඉක්මණින් නැවත ගණනය කිරීමෙන් පසුව පියවීමට කටයුතු කරනු ලැබේ. | දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡාකර අවසාන එකඟතාවයකට පැමිණිය යුතු වීම. |
| (ආ)ව්‍යවස්ථාපිත ගෙවීම් අදාළ කාලපරිච්ඡේදයන් තුළදී නිරවුල් කළ යුතු වුවව, 2017 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.2,381,117 ක් වූ ගෙවිය යුතු ආදායම් බදු ශේෂය නිරවුල් කිරීමට සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නෙතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ව්‍යවස්ථාපිත ගෙවීමක් වූ ආදායම් බදු ශේෂය නිරවුල් කිරීමට කළමනාකරණය විසින් ක්‍රියාකල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.246,874,417 ක පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු.128,503,752 ක් විය. ඒ අනුව පාඩුව රු.118,370,365 කින් වැඩිවී තිබූ බව නිරීක්ෂණය විය. මෙලෙස තවදුරටත් පාඩුවක් පැවතීමට ශ්‍රී ලංකා රජය මගින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත මාගම්පුර වරාය කළමනාකරණ පුද්ගලික සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 නොවැම්බර් 13 දින අවසන් කර තිබීම හේතුවෙන් මෙහෙයුම් ආදායම් නොමැතිවීම සහ ණය මත පොළිය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| | 2020 (රු) | 2019 (රු) |
|---|---|---|
| ආදායම | - | - |
| ඍජු වියදම් | - | - |
| පරිපාලන වියදම් | (10,664,971) | (7,191,239) |
| මෙහෙයුම් ලාභය/(අලාභය) | (10,664,971) | (7,191,239) |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | (142,218,752) | (148,185,664) |
| විදේශ විනිමය ලාභය/(අලාභය) | (93,990,694) | 26,873,152 |
| බදු පෙර ශුද්ධ ලාභය | (246,874,417) | (128,503,752) |
| ආදායම් බදු | - | - |
| බදු පසු ශුද්ධ ලාභය | (246,874,417) | (128,503,752) |

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

i. සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 නොවැම්බර් 13 දින අවසන් කර තිබීම හේතුවෙන් 2019 හා 2020 වර්ෂයන් තුල මෙහෙයුම් කටයුතු වලින් සමාගමට ආදායම් ලැබී නොතිබුණි.

ii. 2019 වර්ෂයේ රු.26,874,152 ක් විදේශ විනිමය ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.93,990,694 ක විදේශ විනිමය අලාභයක් බවට පත්වී තිබුණි.

iii. 2019 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පරිපාලන වියදම් රු.3,474,732 කින් හෙවත් සියයට 48 කින් වැඩිවී තිබුණි.

## 2.3. අනුපාත විශ්ලේෂණය

| | 2020 | 2019 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 1:3.40 | 1:3.29 |
| ක්‍ෂණික වත්කම් අනුපාතය | 1:3.43 | 1:3.32 |

2019 වර්ෂයේ ජංගම අනුපාතය හා ක්‍ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 1:3.29 සහ 1:3.32 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එය පිළිවෙලින් 1:3.40 ක් සහ 1:3.43 ක් ලෙස වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2018 වර්ෂයේදී සමාගමේ සේවකයන් වන්දි ගෙවා ඉවත් කිරීමේදී ඇති වූ ආරවුල් සහගත තත්ත්වය කොළඹ කාර්මික අධිකරණයේ, කාර්මික බේරුම්කරණ අංක.A/37/2017 දරන තීරණය සහ 2018 පෙබරවාරි 02 දින පාර්ශවකරුවන් අතර ඇති කර ගන්නා ලද සමථ කොන්දේසිවලට එකඟ වීම මත අවසන් කර තිබුණි. සමථ ගිවිසුමේ කොන්දේසි අංක 18 (ආ) අනුව 2017 නොවැම්බර් මාසය සඳහා හිඟ අතිකාල දීමනා සහ/හෝ 2018 ජනවාරි දක්වා හිඟ වැටුප් ගෙවිය යුතුව ඇත්නම්, එම ගෙවීම් 2018 පෙබරවාරි 28 වන දිනට පෙර ගෙවා නිම කළ යුතු බවට එකඟ වී තිබුණි. සමාගම | සමථ මණ්ඩල සාකච්චා වලට සහභාගී වී ඇත්තේ එවකට සමාගමේ කළමනාකාරීත්වයයි. එම සමථ කොන්දේසි වල 18 " අ " සහ " ආ " යටතේ සේවකයන්ගේ හිඟ සිටින ලද වැටුප් ගෙවීම සම්බන්ධයෙන් එකඟ වූ කොන්දේසි දක්වා ඇත .එම කොන්දේසි එකඟවූ පදනම පහත පරිදි වේ .<br>2017 නොවැම්බර් මාසයේ 29 වන දින සියළුම සේවකයන් වෙත පරිශ්‍රයෙන් ඉවත් වන ලෙස දැනුම් දෙන ලදී.<br>ඒ වන විට නොවැම්බර් මාසයේ එතෙක් වැඩ කල කාලසීමාවට අදාළව අතිකාල දීමනා සහ වැටුප් ගෙවීම සිදු නොකර තිබු බැවින් විශේෂයෙන්ම නොවැම්බර් මාසය සඳහා ඇතිකාල දීමනා ගෙවන ලෙස එකඟ වී ඇත .<br>එමෙන්ම බහුතරයක් සේවකයන්ගේ 97% පමණම මූලික වැටුප රු .12,000 - 20,000 අතර පැවතිනි .එබැවින් කාර්යසාධන දීමනාව සෑම සේවකයෙක් වෙතම ස්ථිර දීමනාවක් | වන්දි මුදල් ගෙවීමේදී සමථ කොන්දේසි අනුව කටයුතු කල යුතුය. එම කොන්දේසිවල පටහැනිව යම් ගෙවීමක් සිදු කර ඇත්නම් අදාල ගෙවීම්වලට වගකිවයුතු නිලධාරීන්ගෙන් ඒවා ආපසු අය කර ගැනිමට කළමනාකරණය ක්‍රියාකල යුතු වීම. |

| | | |
|---|---|---|
| විසින් එම එකග වූ කොන්දේසිවලට පටහැනිව සමාගමේ මෙහෙයුම් අක්‍රියව පැවති 2017 දෙසැම්බර් සහ 2018 ජනවාරි මාසයන්ට අදාලව ගමන් වියදම්, නවාතැන් දීමනා, කාර්යසාධන දීමනා හා වාහන දීමනා ලෙස රු.12,211,073 ක් වූ වෙනත් දීමනාවන් සේවකයන් වෙත ගෙවා තිබුණි. මේ පිළිබඳව 2017, 2018 සහ 2019 වර්ෂවල විගණන වාර්තා මගින් ද පෙන්වා තිබු නමුත් අදාල කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර වැඩිපුර ගෙවීම් සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීම සඳහා කළමනාකරණය සහ වගකිවයුතු පාර්ශවයන් විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලෙස සමාගම විසින් ආරම්භයේ සිටම ගෙවා තිබුණි . තවද, ඉන්ධන, ප්‍රවාහන, නවාතැන් දීමනා ආදිය ගෙවනු ලැබුවේ සමාගමේ මධ්‍ය සහ ඉහළ කළමණාකාරීත්වයේ සේවකයන් 07 දෙනෙක් සඳහා පමණි . එම සේවකයන් වෙත සමාගමේ අවශේෂ කටයුතු පවත්වාගෙන යාම සඳහා දිගටම සේවයේ නිරතවන ලෙස උපදෙස් ලබා දී තිබුණි . සේවකයන් 360 කට වඩා සේවය කල සමාගමක් එක් වරම ව්‍යාපාර කටයුතු නතර කලද සේවකයන් ඉවත් කිරීම , වන්දි මුදල් සාකච්චා කිරීම , වත්කම් පැවරීම , ලියවිලි ඉවත් කරගැනීම ආදී කටයුතු සඳහා ආයතනය නියෝජනය කරමින් සේවකයින් සිටිය යුතුය .එම සේවකයින් 2018.01.31 දක්වාම සිය සේවය පෙර පරිදි ම ආයතනය වෙත ලබා දෙන ලද බැවින් ඔවුන්ගේ සියළු වැටුප් ගෙවිය යුතුය. | |
| (ආ)ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් තුල ගෙවීම් වවුචර් සියල්ල අනුක්‍රමික අංක අනුව පිළියෙල කොට ආරක්‍ෂා සහිතව තබා ගත යුතුය. එසේම සියළුම වවුචර් විගණනය සඳහා සම්පූර්ණ කර සුදානම් කර තැබීමට වවුචර් භාර නිලධාරියා වගබලා ගත යුතු වුවද, මාගම්පුර වරාය කළමනාකරණ සමාගම විසින් 2017 සහ 2018 වර්ෂවලදී ගෙවීම් කරන ලද පිළිවෙලින් රු.29,975,094 කට රු. 4,543,395 ක අදාළ ගෙවීම් වවුචර් 123 ක් 2021 මැයි 15 දින දක්වාම විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | හම්බන්තොට වරාය පරිශ්‍රයෙන් පැය කිහිපයක් වැනි ඉතාමත් කෙටි දැනුම්දීමකින් සියළු සේවකයන් සහ ෆයිල් ආදිය ඉවත් කර ගැනීමට සිදු විය, එසේම සේවකයන් පරිශ්‍රය තුල බලෙන් රැඳී සිට වෘත්තීය ක්‍රියාමාර්ගයකට එලැඹෙන ලදී. එවන් පසුබිමක් තුල මෙම ලියකිවිලි අස්ථාන ගත වීමේ සම්භාවීතාවක් තිබූ බව එවකට සභාපති විසින් ද ඔබ වෙත කරුණු දක්වා ඇත. කෙසේ උවත් මෙම ගෙවීම් වලට අදාල චෙක් පත් වල පිටපත් ඔබ වෙත ඉදිරිපත් කර ඇත | සමාගමේ ලිපි ලේඛණ හා වත්කම් පරිශ්‍රයෙන් ඉවත්වීමේදී විධිමත්ව හා ක්‍රමානුකූලව සිදු කර නොමැති හෙයින් ඒ පිළිබඳ වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2. ප්‍රසම්පාදන කළමනාකරණය**

**විගණන නිරීක්ෂණය**

ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අරමුණු අනුව ප්‍රසම්පාදනයකදී වඩාත් යහපත් වූ විනිවිදභාවයක් හා මනා පරිපාලනයක් පැවතීම තහවුරු කිරීමට සමාගම වගබලා ගත යුතු වුවත්, සමාගම විසින් 2020 වර්ෂයේදී ආයතනයේ නීතිමය කටයුතු සඳහා පෙනී සිටින නීතිඥ සමාගමකට රු.7,250,000 ක මුදලක් නීති වියදම් ලෙස ගෙවා තිබුණ ද, එම නීතිඥයන් තෝරා ගැනීමේදී විනිවිදභාවයකින් හා මනා පරිපාලනයකින් යුක්ත ක්‍රමවේදයක් අනුගමනය කරන ලද බවට තොරතුරු හා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. එසේම අදාළ නීති උපදේශක සමාගම සමඟ එළඹෙන ලද ගිවිසුම් ද විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

ආයතනයේ නීතිමය කටයුතු සඳහා පෙනී සිටි නීතිඥයන්ට කරන වියදම් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ගෙවා ඇත.නව අධ්‍යක්ෂක මණ්ඩලය රැස්වූ පළමු අවස්ථාවේ දී කොළඹ දිසා අධිකරණයේ පනවා ඇති DDR 1347/19 දරණ නඩුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කරන ලදී. එම නඩුව 2020.08.18 දින අධිකරණයේ කැඳවීමට නියම කර තිබුණි. මෙම නඩුවල විශේෂත්වය වන්නේ නඩුව කඳවන ප්‍රථම දිනයේදීම විරෝධතා ගොනු කළ යුතු බවයි. එසේ නොවුනහොත් ගරු අධිකරණය විසින් නඩුවේ ඉල්ලා ඇති බිලියන 4.4 මුදල සඳහා නෛසයි තීන්දු ප්‍රකාශය නියම කළහොත් සමාගම බරපතල අර්බුදයකට පත් වේ.මන්ද ඒ වන විටත් සමාගම සතුව තිබූ මුදල බිලියන 1.2 කට ආසන්න මුදලක් නිසාවේ. ඒ අනුව හැකි ඉක්මණින් ගරු අධිකරණය එකී විරෝධතා ගොනු කිරීමට අවශ්‍ය වූ නිසා ඒ සඳහා කාලයක් නොතිබූ බැවින් විශ්වාසවන්ත සහ හැකි ඉක්මණින් විරෝධතා සකස්කිරීම සඳහා නීතිඥ උපදෙස් ලබා ගැනීම ප්‍රධාන අවශ්‍යතාවයක් වූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ඉහත නීතිඥ වරුන්ගෙ සහය ලබා ගන්නා ලදී. එහිදි නීතිඥ වරුන් සඳහා නීතිඥ ගාස්තු මුදලින් ගෙවා ඇත්තේ සම්පූර්ණ නඩු කටයුත්ත සඳහා වේ. නැවත කිසිදු ගෙවීමක් මේ සඳහා සිදු නොකෙරේ.

නඩුවේ නීතිඥවරුන් සඳහා ගෙවන ගාස්තු මඟින් පහත සම්පූර්ණ කරුණු ආවරනය වේ.

1. නීතිඥ හමුවීම් සහ උපදෙස් ලබා ගැනීම.
2. විරෝධතා ගොනු කිරීම්.
3. නඩුවට අදාලව ලිඛිත දේශන ගොනු කිරීම.
4. නෛතික කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්ණයක් ගොඩනැගුණහොත් ලිඛිත දේශන ගොනු කිරීම.
5. අධිකරණයේ පෙනී සිටීම. ආදී සියළු කටයුතු කිරීම සඳහා.

**නිර්දේශය**

ප්‍රසම්පාදන කටයුතු වලදී විනිවිදභාවයකින් හා මනා පරිපාලනයකින් යුක්ත ක්‍රමවේදයක් අනුගමනය කිරීම කළමනාකරණයේ වගකීම වේ.